ආචාර්ය විජයදාස රාජපක්ෂ
ජනාධිපති නීතිඥ, පා. ම.
சனாதிபதி சட்டத்தரணி கலாநிதி விஜயதாச ராஜபக்ஷ, பா.உ.
Dr. Wijeyadasa Rajapakshe, President's Counsel, M.P.
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය
நீதி, சிறைச்சாலைகள் அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சர்
Minister of Justice, Prison Affairs and Constitutional Reforms

මගේ අංකය / எனது இல. / My Ref.

ඔබේ අංකය / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2024.07.15

ගරු සභාපති සහ අනෙකුත් සාමාජිකවරුනි,
ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව,
රාජගිරිය.

හිතවත් මහත්මාවරුණි / මහත්මියණි,

**<u>2023 අංක 03 දරණ මැතිවරණ වියදම් නියාමන පනත යටතේ බලතල ක්‍රියාත්මක කිරීම</u>.**

ශ්‍රී ලංකාවේ සර්ව ජන ඡන්ද අයිතිය ජනතාවට ලබා දුන්නේ වුවද, මුල පටන්ම මැතිවරණවලදී සිදුවන දූෂණ හේතුවෙන් ජනතාවගේ සත්‍ය නියෝජනය ප්‍රතිඵල මඟින් නිරූපණය වී නොමැත. එම දූෂණ අතර අල්ලස්, භිය ගැන්වීම, රැවටීම, බලපෑම් කිරීම යනාදී දෑ වන අතර ජනතාවගේ දුගී දුප්පත්කම යොදාගෙන ඔවුන්ව රවටන අවස්ථාවන් අතීතයේ දී අප්‍රමාණව සිදුවන ලදී. 1970 මැතිවරණයේදී හඳෙන් හෝ ගෙනවිත් හාල් සේරු දෙක නොමිලේ ලබා දෙන බව පවසා 2/3ක ආණ්ඩුවක් බලයට පත්වූ අතර ධාන්‍ය ඇට රාත්තල් 8ක් දෙන බව පවසා 5/6 ක ආණ්ඩුවක් 1977 දී බලයට පත්විය. එමෙන්ම ඊට පසු පවත්වන ලද මැතිවරණ වලදී බොහෝ ජනතාව ඡන්දය පාවිච්චි කලේ ජනසවිය, සමෘද්ධිය, දිවිනැගුම වැනි සහනාධාර ලබා ගැනීමේ බලාපොරොත්තුවෙනි. එමෙන්ම නීතියෙන් තහනම් වුවද පසුගිය මැතිවරණවලදී අපේක්ෂකයන් රාජ්‍ය දේපල මැතිවරණවලට යොදා ගැනීම බහුලව දක්නට ලැබුණි. සමහර අමාත්‍යවරු රාජ්‍ය මුදල් මැතිවරණ වියදම් සඳහා බව පවසමින් ම අවභාවිතා කරන ලදී.

පාසල් පොත්, වහල සෙවිලි තහඩු, වැසිකිලි පෝච්චි, ඔරලෝසු, සාරි පමණක් නොව 2015 පාර්ලිමේන්තු මැතිවරණයේදී මාධ්‍ය වාර්තා කලේ එක් දේශපාලන පක්ෂයක් බදුල්ල දිස්ත්‍රික්කයේ වතුකරයේ අරක්කු බෝතල් 50,000ක් සහ රොටී පුච්චන යකඩ තැටි 50,000ක් බෙදා දුන් බවය. එමෙන්ම තරුණ තරුණියන්ට රැකියා ලබා දෙන බවට පොරොන්දු වී ඡන්දය ලබාගත් අවස්ථා අනන්තය. පසුගිය මැතිවරණයේ දී ජනතාවට පොහොර නොමිලේ ලබා දෙන බව පවසා ඡන්දය ලබා ගෙන පොහොර ලබා දීම මුළුමනින් ම අහෝසි කළේය. රටේ කෘෂිකර්මාන්තය වසර දහයකටවත් ගොඩගත නොහැකි ලෙස විනාශ විය.

පසුගිය මැතිවරණ ඉතිහාසය දෙස බැලූවිට අඩු වැඩි වශයෙන් විශාල ප්‍රමාණයේ දූෂණ සිදුව ඇත. විශේෂයෙන් ජනතාවගේ දුප්පත්කම භාවිතා කරමින් දේශපාලන අවභාවිතයන් සිදුකිරීම රට බංකොලොත්භාවයට පත්කිරීමට හේතුවිය. පසුගිය 2020 මැතිවරණයේ දී පවා නීතිවිරෝධී ලෙස ද්‍රව්‍ය බෙදා දීම සිදුවූ අතර කොළඹ දිස්ත්‍රික්කයේ පවා ලොරිවලින් ගෙනගොස් හාල් බෙදුවේ ඡන්දයට දින කිහිපයකට පෙරය. කොළඹ වතු නිවාස ආශ්‍රිතව සුරා මත්වතුර සහ සහල් බෙදීම සුලභ දර්ශණයකි.

පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයේ සමහර අපේක්ෂකයෙක් රුපියල් මිලියන 200ක් වැනි මුදල් සම්භාරයක් වියදම් කරන ලද බව පැහැදිලිය. එක් දිස්ත්‍රික්කයක අපේක්ෂකයෙකු රුපියල් මිලියන 1000ක් තරම් වියදම් කළ බව පවසනවා මට ඇසී ඇත. වැඩිප්‍රමාණයක් මත්වතුර සඳහාය. නමුත් එම අපේක්ෂකයන් ආධායම් බදු ලෙස සතයක් ගෙවා නොමැත. සමහර වත්කම් හා බැරකම් ප්‍රකාශනයන් පවා භාර දී නොමැත. එසේ වියදම් කරන්නේ අල්ලස්, කොමිස්, කප්පම් ලෙස ලබාගත් කළු සල්ලි වන අතර ජාවාරම්කරුවන්ද ඔවුන් වෙනුවෙන් වියදම් කරයි. කුඩු ජාවාරම්කරුවන්ද ඒ අතර වේ. මත්පැන් බලපත්‍ර, ඉන්ධනහල් බලපත්‍ර, රජයේ ටෙන්ඩර් යනාදිය බලාපොරොත්තුවෙන් එසේ මුදල් වියදම් කිරීම මෙරට සුළභ ලක්ෂණයකි. මේ අතරට විදේශීය රටවල්වලින් එන මුදල් ද වේ.

මේ වන විට සමහර පක්ෂ මැතිවරණ අරභයා නිරන්තරයෙන් ලෝකයේ ධනේෂ්වර රටවලට ගොස් මුදල් එකතු කිරීම ව්‍යාපාරයක් ලෙසටම සිදු කරයි. එම මුදල් පක්ෂ අරමුදලට බාරකිරීමක් හෝ නොවන අතර ඒවා සියල්ල වර්තමානයේ පවතින මැතිවරණ නීතියට පටහැනි දණ්ඩනීය වරදවල් වේ.

මෙරට පවතින මෙම අභාග්‍යවන්ත මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය උඩුයටිකුරු කර ඇති මැතිවරණ සංස්කෘතිය වෙනස් කර නීතියේ ආධිපත්‍ය ස්ථාපිත වූ ප්‍රජාතන්ත්‍රවාදයක් සඳහා මැතිවරණ කොමිසමේ පූර්ණ සහයෝගය ඇතිව අප 2023 අංක 03 දරණ මැතිවරණ වියදම් නියාමන පනත ඉදිරිපත්කොට සම්මත කරගන්නා ලදි. මෙම පනත සම්මත කර ගැනීම ඉතා අසීරු ඉලක්කයක් වූ අතර විපක්ෂයේ පක්ෂ මෙම පනතට විරුද්ධව ඡන්දය දුන් හේතුව කොමිෂමට මෙන්ම ජනතාවටද අවබෝධ කරගත හැකිය. එම පනත ජනාධිපතිවරණ, පාර්ලිමේන්තු, පලාත් සභා හා පලාත් පාලන මැතිවරණ සියල්ලටම බලපාන පනතකි.

ඉදිරියේ පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණය හා පාර්ලිමේන්තු මැතිවරණය සඳහා දේශපාලන පක්ෂ වලින් හා ස්වාධීන ලෙස ඉදිරිපත් වන අපේක්ෂකයන්ගේ වත්කම් හා බැරකම් ඇතුළු අවශ්‍ය තොරතුරු ලබා ගැනීමත්, එක් එක් දේශපාලන පක්ෂයකට සහ අපේක්ෂකයෙකුට වියදම් කල හැකි උපරිම මුදල සීමා කිරීමත් කොමිෂන් සභාවේ වගකීමකි.මෙම නීතිය බලාත්මක වූ 2023 ජනවාරි 24 වන දිනෙන් පසුව මේ දක්වා මැතිවරණයක් පවත්වා නොමැත. පාර්ලිමේන්තු මැතිවරණ වලදී සිදුවන නීති විරෝධී ක්‍රියා, අල්ලස්, කප්පම් වැනි සිදුවීම් සඳහා වර්තමානයේ පවතින සමානුපාතික මැතිවරණ ක්‍රමය යටතේ නීතිය අකර්මණ්‍ය වී ඇත.

පාර්ලිමේන්තු හෝ පලාත්සභා මැතිවරණයකදී යම් අපේක්ෂකයෙක් නීති විරෝධී ක්‍රියා, කප්පම් ගැනීම්, අල්ලස් ගැනීම්, අනුබල දීම්, බිය වැද්දීම් කිරීම් යනාදිය සිදුකලත් එය එම මැතිවරණ දිස්ත්‍රික්කයේ සමස්ථ ප්‍රතිඵලයට බලපා නොමැත්තේ නම් අපේක්ෂකයෙකු පත්වීම් අවලංගු කල නොහැකි බවට අධිකරණය විසින් දී ඇති තීන්දු නිසා වක්‍රකාර ලෙස ව්‍යවස්ථාපිත නීතිය අවලංගු වී ඇත. ඊට පෙර එවැනි දූෂණ සම්බන්ධයෙන් මැතිවරණ නඩු මඟින් බොහෝ දෙනාගේ මන්ත්‍රීධූර අහෝසි වූ නමුත් වර්තමානයේ ක්‍රියාත්මක තත්ත්වය නිසා ජනතාවගේ අපේක්ෂා හංග වී ඇත.

මෙම තත්ත්වයන් සලකා බලා නව පනත යටතේ මැතිවරණ කොමිෂන් සභාව ක්‍රියාකරනු ලබන ආකාරය දැනගැනීමට ජනතාවට ඇති අයිතියට ගරු කරමින් දේශපාලන පක්ෂ ලේකම්වරු සහ/හෝ කොමිෂන් සභාව යෝග්‍යයයි කල්පනා කරන තැනැත්තන් කැඳවා සාකච්ඡාවක් පවත්වන ලෙස මම ඉල්ලා සිටිමි.

මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ව්‍යවස්ථානුකූලව තේරීපත් වූ සභාපති වුවත් දැනට එම තනතුර අධිකරණ නියෝගයක් විසින් වාරණය කර ඇත. මැතිවරණ වියදම් නියාමන පනත ඉදිරිපත් කර සම්මත කරගත් අධිකරණ අමාත්‍යවරයා ලෙස එම පනත නිසි ලෙස ක්‍රියාත්මක වීම තහවුරු කිරීම මාගේද වගකීමක් වනු ඇත.

ඔබ කොමිෂන් සභාව ඒ සඳහා දිනයක් හා වේලාවක් නියම කරන ලෙස ඉල්ලා සිටින අතර ශ්‍රී ලංකා පොලිසියේ සහ අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාවේ නියෝජිතවරයන්ගේ සහභාගීත්වය ඉතා ඵලදායක වනු ඇතයි මම විශ්වාස කරමි.

එමෙන්ම මෙම පනත සම්මත කර ගැනීමේදී සිවිල් සමාජය දැනුවත් කරමින් මා හට විශාල ශක්තියක් ලබාදුන් සාධාරණ සමාජයක් උදෙසා ව්‍යාපාරයේ නායක හිටපු කථානායක දේශමාන්‍ය ගරු කරු ජයසූරිය මහතාගේ සහභාගීත්වයද වැදගත් බව සඳහන් කිරීමට කැමැත්තෙමි.

අප්‍රමාදීව ලැබෙන පිළිතුරක් අගේ කරමි.

ජනාධිපති නීතිඥ ආචාර්ය විජයදාස රාජපක්ෂ
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය

ආචාර්ය විජයදාස රාජපක්ෂ
ජනාධිපති නීතිඥ
අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය